# හඳුන්වාදීම

ඔබ මේ ගැන සිතා බැලුවාද? ක්‍රිස්තියානු ආගමික පූජක සොයුරියක් තම හිසේ සිට දෙපා වනතෙක් වස්ත්‍රයකින් ආවරණය කරන නිසාවෙන්, දෙවියන්වහන්සේ වෙනුවෙන් කැප වී ක්‍රියාකිරීම උදෙසා මිනිසුන් ඇයට ගරු කරයි, නමුත් මෙම දෙයම මුස්ලිම් කාන්තාවක් විසින් ඉටු කළා නම්, ඇය හිංසා පීඩා විඳිමින් දුක්ඛිත ජීවිතයක් ගතකරන අයෙක් ලෙසට දකින්නේ ඇයි? එසේත් නැතිනම් යුදෙව්වෙක් රැවුල වැවූ විට ආගමට ලැදි පුද්ගලයෙක් ලෙස සලකන නමුදු, මුස්ලිම් වරයෙකු එම දේම කළේ නම් අන්තවාදියෙකු ලෙස ලේබල් ගසන්නේ ඇයි?

ඇතැම් බටහිර ජනතාව ඉස්ලාමය පිළිබඳව වැරදි ආකල්පයන් දරාසිටී. බටහිර ලෝකය දියුණු, දීප්තිමත්, නිදහස් තැනක් ලෙසත්, ඉස්ලාමය ඊට හාත්පසින් ප්‍රතිවිරුද්ධ බවත් අශෝභන, නූගත් සහ පීඩිත බවත් බොහෝ දෙනා විශ්වාස කරයි. මෙවැනි මතවලට ප්‍රධාන හේතුව මාධ්‍යයයි, මාධ්‍යය විසින් බටහිර ජනයාට පෙන්වා දෙන්නේ ඉස්ලාමයේ නීති වලට හාත්පසින් වෙනස් වූ මුස්ලිම්වරුන් ගේ සමහර වැරදි ක්‍රියාකාරකම්ය. ඉස්ලාමය හා මුස්ලිම්වරුන් යනු කව්රුන්දැයි තේරුම්ගනීමට නම් එක් එක් අවස්ථාවට අදාලව ඉස්ලාමීය ඉගැන්වීම මොනවාද යන්න දැනගෙන සිටීම නුවණට හුරුය. මෙම හේතුව කරනුකොටගෙන, වඩාත්ම පොදු වූ වැරදි මත කිහිපයක් පිළිබඳව ඔබව දැනුවත් කිරීම අපගේ වගකීමක් ලෙස සලකන්නෙමු.

## " හිජාබය අඳින්නේ පීඩිතයන් වේ "

වැරදි මතය 1

හිජාබය යැයි ඇත්තෙන්ම අදහස් කරන්නේ කුමක්ද ? හිජාබය යනු ස්ත්‍රීයකගේ අලංකාරය අන් පිරිමින්ට නොපෙන්වන පරිදි ආවරණය කර ගැනීමයි. එය බාහිර ආවරණයට පමණක් සීමා වූවක් නොවේ, ඉන් අභ්‍යන්තරව නිර්මාණය විය යුතු නිහතමානීබව, ආචාරශීලීත්වය, ගෞරවය හා යහපත් වූ චර්යාවද අයත් වෙයි.

සිය කැමත්තට අනුව ස්වාමි පුරුෂයෙක් තෝරා ගැනීම, දේපළ උරුමය අධ්‍යාපනය ලබා ගැනීම, සහ වැදගත් රැකියාවක නිරතවීම මෙන්ම ස්වකීය මතය ප්‍රකාශ කිරීම වැනි කිසිම දෙයකට හිජාබයෙන් සීමා ඇටවෙන්නෙ නැත. හිජාබය ස්ත්‍රීයකගේ ගරුත්වය සහ උත්තමශීලිබව ආරක්ෂා කර එය ඉහළ නංවයි, ඇයගේ බාහිර අලංකාරයට වඩා ඇයගේ අධ්‍යාත්මික අලංකාරය ඔප්නංවන බවට සහතිකයකි. හිජාබය ඇයගේ තරාතිරම වැඩිකරයි, ඇයගේ කාමුකත්වයට වඩා ඥානයට තැනක් ලබා දෙයි.

මුස්ලිම් කාන්තාවන් තම අඟපසඟ වසා ගන්නේ දෙවියන්වහන්සේගේ අණ පිළිපැදීමට දක්වන ලැදියාව නිසාවෙනි. එය දෙවියන්වහන්සේගේ විසින් පිළිපැදිය යුතු අනිවාර්‍ය ක්‍රියාවක් ලෙස අණ කොට ඇත. එසේම සිය නිර්මාණයන්ට වඩාත් උචිත වන්නේ කුමක්ද යැයි හොඳාකාරවම දන්නේ දෙවියන්වහන්සේ පමණි.

හිජාබය, කාන්තාවගේ විනීතබව රැකගනිමින් සමාජයේ ක්‍රියාකාරී සාමාජිකාවක් වීමට නිදහස දෙයි. හිජාබයෙහි අවශ්‍යතාවය රදා පවතින්නේ ඇය කිසියම් වූ පොදු ස්ථානයක සිටින විට පමණි, නිවස අභ්‍යන්තරයේ තම පවුලේ උදවිය සමඟ සිටියදී එය අවශ්‍යය වන්නේ නැත.

හිජාබය පැළඳීම මගින් ඉන් කිසිමකෙනෙකුට යටත් වීම, පීඩිත බව, නිහඬකරවීම නිරූපනය නොකරයි. එය ස්ත්‍රීයට එල්ලවන අනවශ්‍යය යෝජනා වලින්ද, නින්දා වන අන්දමේ අදහස්වලින්ද, අසාධාරණ ලෙස විවේචන කිරීම්වලින්ද ආරක්ෂා කරයි.

"නබිතුමණි!
ඔබගේ භාය්‍යාවන්ටද
ඔබගේ ගැහැනු දරුවන්ටද හා
විශ්වාසවන්ත ගැහැනුන්ටද (ඔවුන්
පිටතට යන විට හෝ පිරිමින් අතරට
යන විට හෝ) ඔවුන්ගේ පිට ඇඳුමෙන්
තමන්ව හොඳින් ආවරණය කර ගන්නා
මෙන් පවසනු මැනව! මෙමගින් ඔවුන්
(ගෞරවණීය පතිවත රකිනා අය යයි)
දැන ගැනීමෙන් කිසිවෙකුගේ
හිංසාවට ලක් නොවීමට හොඳ
(මාර්ගයක්) වනු ඇත"
අල්-කුර්ආන් 33:59

ඉස්ලාමය අළුතින් වැළඳගන්නන්ගෙන්, ආසන්න වශයෙන් 75% පමණ වන්නේ කාන්තාවන්ය. සිතන්න ! ඔබ ඔබව පීඩාවට පත්කරන ආගමක් වැළඳගැනීමට තෝරාගන්නේද? එසේනම් මීළඟ වතාවෙ ඔබ මුස්ලිම් කාන්තාවක් දකිනා විට, සිතන්න ඇය ආවරණයකරන්නේ ඇයගේ සිරුර මිස, ඥානයවත් හෝ චින්තනය නොවන බව

## " ඉස්ලාමය කාන්තාව පීඩාවට පත් කරයි "

වැරදි මතය 2

මුස්ලිම් කාන්තාව පිළිබඳව සමාජය විසින් දරන වැරදි මතයක් වන්නේ ඉස්ලාමය විසින් ඇයව පීඩාවට සහ නින්දාවට පත් කරන බව පැවසීමයි. ඉස්ලාමීය ඉගැන්වීම් වලට අනුව දෙවියන්වහන්සේගේ බැල්මෙහි විශිෂ්ඨතමයා වන්නේ දේව භක්තිය ඇති පුද්ගලයාය

"ඔබගෙන් දේව
භක්තිකයෙකු වශයෙන්
සිටින්නා නියත වශයෙන්ම
අල්ලාහ්ගේ සන්නිධානයෙ-
යහි ඉමහත් ගෞරවණීය
තැනැත්තෙකු වන්නේය"
අල්-කුර්ආන් 49:13

ඉහත වාක්‍යයෙන් පැහැදිලි වන්නේ, දෙවියන්වහන්සේගේ සැබෑ ගෞරවය ලඟාකරගත හැක්කේ ආර්ථික තත්වය හෝ, සමේ වර්ණය මත හෝ, ස්ත්‍රී පුරුෂභාවය අනුව නොව අවංක දේව භක්තිය තුලින් බවයි. ඉස්ලාමය වැළන්දගන්නා පිරිස අතුරින් පහෙන් හතරක්ම කාන්තාවන් වන අතර පහෙන් එකක් පමණක් පිරිමියෙකු වේ.

මෙලෙස කාන්තාවන් බොහෝ දෙනෙක් ඉස්ලාමයට අධිකව නැඹුරු වීමට හේතුව පහත දක්වා ඇති අයිතීන් ඉස්ලාමය විසින් කාන්තාවට ලබා දී ඇති නිසාය.

- තම ධනය සම්බන්ධ පූර්ණ අයිතිය
- සහකරුවෙකු තෝරාගැනීමේ අයිතිය
- විවාහයට පසු වුවද තම පෙලපත් නාමය පවත්වාගෙන යෑමට ඇති හැකියාව
- දේපල අයිති කරගැනීමටද, වෙළඳාමක් පාලනය කිරීමටද, සම වැඩ සඳහා සම වැටුප් ලැබීමේ අයිතිය
- දේපල උරුම වීමේ අයිතිය, දික්කසාද වීමේ හැකියාව (රිසි හේතුන් නිසා)
- පිරිමින් සහභාගී වන සියලු නැමදුම් වලට සහභාගී වීමේ අයිතිය

බටහිර ලෝකයේ කාන්තාවන් හට තවමත් නොමැති සමහර අයිතීන් වසර 1400 කට පෙර, ඉස්ලාමය කාන්තාවන්ට ලබා දුන්නේය
http://en.wikipedia.org/wiki/Women's_rights
(please check this site, very important information related to this topic)

"පිරිමින් වුවද
ගැහැනුන් වුවද කවුරුන්
විශ්වාසවන්තයින් වී ඔහු (හෝ ඇය)
දැහැමි ක්‍රියාවන් කරන්නේද නියත
වශයෙන්ම අපි ඔවුන්ට හොඳ
ජීවිතයක් ගත කිරීමට සලස්වන්නෙමු.
තවද ඔවුන් කරමින් සිටි දැයට අනුව
නියත වශයෙන්ම ඉතාමත් හොඳ
ඵලවිපාක (පරලොවදී) අපි ඔවුන්ට
දෙන්නෙමු".
අල්-කුර්ආන් 16:97

ඇත්තෙන්ම පවසනවා නම්, පීඩාවට ලකවන, නිසි අයිතීන් නොලැබෙන බොහෝ මුස්ලිම් කාන්තාවන් සිටි. නමුත්, මෙය ඉස්ලාමයේ මඟපෙන්වීමක් නොවන අතර එය ලෝකයේ බොහෝ තැන වල සිටින නූගත් මිනිසුන්ගේ නොදැනුවත්කම කම නිසා, ඔවුන් විසින් සංස්කෘතියට මූලිකත්වය දී කරන අකටයුතුකම්ය.

ඉස්ලාමය කාන්තා අයිතිවාසිකම් සුරකින අතරම, කාන්තාවන් සහ පිරිමින් සර්වසම නොවන බව ඒත්තු ගන්වයි. දෙවියන්වහන්සේ මෙසේ පවසයි

"...එසේම පිරිමියා ගැහැනිය මෙන් නොවෙයි..."
(කුර්-ආනය 3:36)

ඉස්ලාමය කාන්තාවට හා පිරිමියාට එකිනෙකට ආවේනිකවූ කාර්‍යය භාරයන් වෙන්කොට හඳුන්වාදී ඇත්තේ මේ නිසාවෙනි. කාන්තාවට නිවසේ වැඩකටයුතු සහ නිවසේ සාමාජිකයන්ගේ අවශ්‍යතා ඉටුකර දීමත්, පිරිමියා විසින් ආර්ථික අවශ්‍යතා සපුරා දීමත්, නිවසේ සාමාජිකයන්ගේ ආරක්ෂාව මෙන්ම නිවස නඩත්තු කිරීම වැනි වගකීම් භාර දී ඇත.

නිගමනයඃ ඉස්ලාමයේ කාන්තාවන් හට දී ඇති උදාර වූ තත්වය පහත දැක්වෙන නබි මුහම්මද් ගේ වදනින් සනාථ වෙයි

"මෙලොව සහ ලොව තුල ඇති සියලුම දේ වටිනා දේ වේ, නමුත් ලොව වඩාත්ම වටිනා දෙය වන්නේ සත්ගුණවත් ශීලාචාර කාන්තාවක්ය"